# ශ්‍රී ලංකා දුම්රිය සේවය

## ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දුම්රිය ස්ථානවල පිහිටි ස්ථාවර භෝජනාගාර බදුදීම සඳහා ප්‍රසම්පාදන කමිටු ලංසු කැඳවීමයි

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් භෝජනාගාර වසර පහක කාලයකට ආහාරපාන අලෙවි කිරීමේ සේවාවන් පවත්වාගෙන යාම සඳහා පහත දක්වා ඇති සුදුසුකම් හා පලපුරුද්දක් ලත් ලංසු කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ලංසුපත් කැඳවනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| **01.** බෙලිඅත්ත | **02.** නානුඔය | **03.**දකුණු කළුතර | **04.**රඹුක්කන |
| **05.**පොල්ගහවෙල වේදිකා | **06.** බණ්ඩාරවෙල | **07.**බදුල්ල | **08.** ගාල්ල |

ඉහත සඳහන් භෝජනාගාර පිළිබඳ විස්තර ප්‍රසම්පාදන ලියවිලි යටතේ උපලේඛණ 01 හි දක්වා ඇත.

**01.සුදුසුකම්**

ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

අදාල ක්ෂේත්‍රයට අදාලව ව්‍යාපාරයක් ලෙස වලංගු ලියාපදිංචියක් සහ වසර 01 ක පලපුරුද්දක් ලබා තිබීම හා මූල්‍යමය ස්ථාවරත්වය තහවුරු කිරීම සඳහා අනුගාමී මාස 03 ක බැංකු ගිණුම් ප්‍රකාශනය ඉදිරිපත් කළ යුතුය.

**02.ලංසු අයදුම්පත්‍ර ලබාගැනීම**

ප්‍රසම්පාදන ලියවිලි **2026 මැයි මස 18** වන දින ප.ව. 2.00 දක්වා දුම්රිය මූලස්ථානයේ වෙළඳ හා අලෙවි කාර්යාලයෙන් හෝ භෝජනාගාරය පිහිටි දුම්රිය ස්ථානයෙන් ලබා ගත හැක. ඒ සඳහා කොළඹ 10 ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන මූල්‍ය නිලධාරි වෙත හෝ අදාල භෝජනාගාරය පිහිටි දුම්රිය ස්ථානයේ දුම්රිය ස්ථානාධිපති වෙත ආපසු ගෙවනු නොලබන ලංසු පෝරම ගාස්තුව ලෙස රු. 2,500/- ක මුදලක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත දුම්රිය මූලස්ථානයේ නියෝජ්‍ය අධිකාරි (වෙළඳ හා අලෙවි) වෙත හෝ අදාල දුම්රිය ස්ථානයන් වෙත හෝ ඉදිරිපත් කළ යුතුය. උපලේඛණ 01 හි සඳහන් සියළු භෝජනාගාර වෙන වෙනම සලකා ලංසු ඉදිරිපත් කළ යුතු අතර, ලංසු පෝරම ගාස්තුවට අමතරව එම ලේඛණයේ දක්වා ඇති පරිදි ආපසු ගෙවනු ලබන ලංසු බැදුම්කරයක්ද ගෙවිය යුතුය. එක් ලංසු පෝරමයක් මගින් ලංසු ඉදිරිපත්කල හැක්කේ එක් භෝජනාගාරයක් සඳහා පමණි.

**03. ලංසු අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම**

ඉහත 02 යටතේ සඳහන් ආකාරයට එක් එක් භෝජනාගාරය වෙනුවෙන් ලබාගන්නා ලද අයදුම්පත්‍ර මුල් පිටපත හා අනු පිටපත නිසි පරිදි සම්පූර්ණ කර කවර දෙකක බහා මුද්‍රා තැබිය යුතුය. එම කවරවල මුල් පිටපත හා අනුපිටපත ලෙස පැහැදිලිව සඳහන් කළ යුතුය. එම කවර දෙක තනිකවරයක බහා වම් පස ඉහල කෙළවරේ භෝජනාගාරයේ ලංසු අංකය හා භෝජනාගාරයේ නම සඳහන් කර “................. (භෝජනාගාරයේ නම) දුම්රිය ස්ථාන භෝජනාගාර සඳහා ටෙන්ඩර් පත” යනුවෙන් සඳහන් කොට, එම කවරය මුද්‍රා තබා **2026 මැයි මස 19** වන දින ප.ව 01.00 පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, වෙළඳ හා අලෙවි කාර්යාලය, දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10. ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ දුම්රිය මූලස්ථාන නියෝජ්‍ය අධිකාරී (වෙළඳ හා අලෙවි) ගේ නිල කාමරයෙහි ටෙන්ඩර්පත් බහාලීම සඳහා සකසා ඇති විශේෂ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ කටයුතු කළ යුතුය. එම වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලේදී ප්‍රමාදවූ හා නැතිවූ අයදුම්පත් පිළිබදව සලකා බලනු නොලැබේ.

**04. ලංසු භාරගැනීම හා විවෘත කිරීම**

**2026 මැයි මස 19** වන දින ප.ව. 1.00 ට ඉහත 03 ඡේදයේ දක්වා ඇති පරිදි වෙළඳ හා අලෙවි කාර්යාලයේදී අයදුම්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට හෝ සහභාගී වීමට ඉඩදෙනු ලැබේ.

**05.** ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සියලු සේවකයන්ට හා ඔවුන්ගේ පවුල්වල ආසන්නම සාමාජිකයන්ට අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා හිමිකමක් නැත.

**06.** ලංසු අයදුම් කිරීමට ප්‍රථම ඉහත සඳහන් සියළු භෝජනාගාර පරික්ෂා කිරීම සඳහා අයදුම්කරුවන් හට අවස්ථාව ලබා දෙන අතර ඒ සඳහා අදාල දුම්රිය ස්ථානය මගින් අවසර ලබාගතයුතු වේ.

**07.** දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**08.** ලංසුකරුවන්ට වැඩි විස්තර අවශ්‍ය නම් දුරකථන අංක :-011-2421281 – (දිගු අංකය -8235)/ 011 - 4600944 මගින් දුම්රිය මූලස්ථානයේ වෙළඳ හා අලෙවි කාර්යාලය වෙතින් ලබාගත හැක.

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,<br>
වෙළඳ හා අලෙවි අංශය, දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10.